## 9. ශීර්ෂය 7 - අධිකරණ සේවා කොමිෂන් සභාව

### 9.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

**කොමිෂන් සභාවේ කාර්යාලය විසින්** පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002 / 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452 (1) |
| (ඈ) | සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 |
| (ඉ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඊ) | උප පත්‍රිකා ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (උ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

### 9.2 විසර්ජන ගිණුම

#### 9.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.450,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 21 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 9.3 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

#### 9.3.1 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

#### 9.3.2 විගණන හා කළමනාකරණ කමිටුව

කොමිෂන් සභාව සඳහා විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**9.4** **වත්කම් කළමණාකරණය**

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ)** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

කොමිෂන් සභාවට අයත් මෝටර් රථයක් වසරක පමණ කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ)** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**9.5** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| *(i)* | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 09 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 54 | 31 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 16 | 08 |
| | **එකතුව** | **93** | **57** | **36** |